# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1412 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 31/08/2024<br>පැය 1915 |

# මාධ්‍ය නිවේදනය

## 01. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - දමන පොලිස් ස්ථානය.

2024.08.30 වන දින දහවල් කාලයේ දමන පොලිස් වසමේ මුවංගල, හිගුරාන ප්‍රදේශයේ නිවසක් තුල පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් සිදුකරන බවට දමන පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු කැණීම් උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 ත් 37 ත් අතර වයස්වල පසුවන හිගුරාන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

දමන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - බෙම්මුල්ල පොලිස් වසම.

2024.08.30 වන දින රාත්‍රී කාලයේ බෙම්මුල්ල පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ අලුත්ගමුව බෝගමුව ප්‍රදේශයේදී කොළඹ දෙස සිට මහනුවර දෙසට ධාවනය කල යතුරුපැදියක් නැවත කොළඹ දෙසට හැරවීමට යාමේදී මහනුවර දෙස සිට පැමිණි බස් රථයක යතුරුපැදිය ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකරු හා පසුපැදිකරු බරපතල තුවාල ලබා ගම්පහ රෝහලට ඇතුලත් කිරීමේදී දෙදෙනාම මියගොස් ඇත.

**මරණකරුවන් වයස අවුරුදු 47 හා 51 ක් වූ ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. බෙම්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - කුරුණෑගල පොලිස් වසම.

2024.08.30 වන දින රාත්‍රී කාලයේ කුරුණෑගල පොලිස් වසමේ කුරුණෑගල පුත්තලම මාර්ගයේ වැලගනේ කන්ද ප්‍රදේශයේදී වාරියපොල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ ලොරි රථයක් ඉන්ධන නොමැති වීම හේතුවෙන් මාර්ගය අයිනේ නවතා තිබියදී, එම දිසාවටම ඊට පිටුපසින් පැමිණි යතුරුපැදියක් ලොරි රථයේ පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකරු බරපතල තුවාල ලබා කුරුණෑගල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ බමුණාවල, කුරුණෑගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කුරුණෑගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**